# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2165/50 - 2020 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2020.03.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* 6/3/1/526.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම පිළිබඳ විස්තරය:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕවිටියාගල නමැති ගමේ, සර්වේයර් ජනරාල්ගේ මූ.පි.ක. 4763 දරන 2019.12.24 දිනැති පිඹුරේ කැබලි අංක 1,2 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.0469ක් වූ පහත විස්තර කර ඇති ඉඩම් කොටස:

1. කැබලි අංක 01

ඉඩමේ නම: ඇල්ලකන්ද වත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0422.

2. කැබලි අංක 02

ඉඩමේ නම: ඇල්ලකන්ද වත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 4.0047.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් කියන අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 මාර්තු මස 25 වන දින පූර්ව භාග 10.00ට හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 මාර්තු මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

කේ.ඩී.එස්. සජීවනා,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හොරණ.

03-817


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය :* කඩු/ඉඩම්/01/74/WS.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* LD/05/2006/WS/329.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධිත පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම/පරවශතාවේ විස්තරය:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 494බී, අරංගල ග්‍රාම නිලධාරී වසමේ හෝකන්දර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.කො. 9862 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0016ක් වූ පහත විස්තර කර ඇති ඉඩම් කොටස:

**මූලික පිඹුරු අංක 9862 හි,**

1. **කැබලි අංක 01**

ඉඩමේ නම: සොයාගත නොහැක; වර්තමාන ඉඩම් පරිහරණය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0016.

ඉහත සඳහන් ඉඩම/පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 අප්‍රේල් මස 06 වන දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 මාර්තු මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඒ.ඩී.වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2020 මාර්තු මස 02 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය,
කඩුවෙල.

03-818